**UNIVERSITY OF PERADENIYA**
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**CENTER FOR DISTANCE & CONTINUING EDUCATION**
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය-2015

(2016 අගෝස්තු)

## ඉතිහාසය VI (HG 6)

## විසිවන සියවසේ ලෝක ඉතිහාසය

කාලය පැය තුන (03) යි.

යටත් පිරිසෙයින් **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මඟින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපා හරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව දොළස (12) කි.

---

### පළමු වන කොටස

1. ''සමකාලීන ඉතිහාසය නිසි ලෙස හැදෑරිය හැක්කේ ලෝක ඉතිහාසයක් වශයෙන් පමණි.'' ලෝක ඉතිහාසය සම්බන්ධයෙන් වූ ඩේවිඩ් තොම්සන්ගේ මෙම ප්‍රකාශය පිළිබඳ විවරණයක් කරන්න.

2. 1929 ලෝක ආර්ථික අර්බුදය විස්තර කර එහි බලපෑම සාකච්ඡා කරන්න.

3. යුරෝපයේ ෆැසිස්ට්වාදයේ නැගීමට බලපෑ හේතු විභාග කරන්න.

### දෙවන කොටස

4. 1949 චීන විප්ලවය පිළිබඳව ඓතිහාසික රචනයක් ලියන්න.

5. දෙවන ලෝක යුද්ධය ආසියාවේ ජාතිකවාදී ව්‍යාපාර කෙරෙහි ඇති කළ බලපෑම සාකච්ඡා කරන්න.

6. දෙවන ලෝක යුද්ධයෙන් පසු ගොඩනැගෙන ලෝක දේශපාලන රටාවේ ප්‍රධාන ලක්ෂණ හඳුනා ගන්න.

## තුන් වන කොටස

7. දෙවන ලෝක යුද්ධයෙන් පසු ඇමෙරිකාව, යුරෝපය හා ජපානය අතර ගොඩනැගෙන සම්බන්ධතාවය විභාග කරන්න.

8. 1945-1989 අතර කාලයේ යුරෝපා ස්ථාවරත්වය සඳහා සමාජ ප්‍රජාතන්ත්‍රවාදය විසින් ඉටුකළ භූමිකාව සාකච්ඡා කරන්න.

9. ''1989 දී සීතල යුද්ධය අවසානවීම විසි වෙනි සියවසේ ලෝක ඉතිහාසයේ සංධිස්ථානයක් විය.'' මෙම මතය සමඟ ඔබ කෙතෙක් දුරට එකඟ වන්නේ ද?

## හතර වන කොටස

10. අරාබි-ඊශ්‍රායල ගැටුමේ විකාශනයට මුල් වූ සාධක විභාග කරන්න.

11. යුරෝපා සංගමයේ ප්‍රධාන ඉලක්ක කවරේ ද?

12. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.

(අ) ජාතීන්ගේ සංගමය

(ආ) මාවෝ-(ත්)සේ-තුං

(ඇ) ජපානයේ SCAP පාලනය

(ඈ) සෝවියට් සංගමය බිඳවැටීම